**2021 වර්ෂය සඳහා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ භාණ්ඩ, සේවා සහ වැඩ කොන්ත්‍රාත් සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

**අයදුම්කරුවන් සඳහා උපදෙස් සහ කොන්දේසි**

2021වර්ෂය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය (Shopping Method) යටතේ භාණ්ඩ, වැඩ හා සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් සහ ඊට අදාල ලියකියවිලි, 2020.12.22 දින සිට 2021.01.12 දින දක්වා කාර්යාලීය දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.15 දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙතින් ද නැතහොත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.agrimin.gov.lk හරහා ද බාගත කර ගැනීමේ හැකියාව ඇත.

සෑමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැළකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවකු ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිළි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**01. අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ලිපිලේඛන**

i. නීතිඥවරයෙකු/නොතාරිස්වරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්/සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (ඉහත ලිපිලේඛනවලට අදාළව 2021.01.01 දිනට වලංගු වන සේ ලියාපදිංචි නොමැති ව්‍යාපාර මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි).

ii. සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා නිෂ්පාදකයා නොවන අවස්ථාවක දී සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා බලයලත් නියෝජිත හෝ බෙදාහරින්නා වන බවට නිෂ්පාදකයා විසින් ලිඛිතව සහතික කළ යුතු ය.

iii. සිවිල් ඉදිකිරීම් වැඩ සඳහා ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කුමන විශේෂිත කාණ්ඩයක්/ශ්‍රේණියක් යටතේ අවසන් වරට (2021.01.01 දිනට වලංගු වන සේ) ලියාපදිංචි වී ඇති ද යන්න තහවුරු කිරීම සඳහා එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය.

iv. ලියාපදිංචි වීම සඳහා අයිතම ගාස්තු ගෙවන ලද මුදල් කුවිතාන්සියේ මුල් පිටපත අනිවාර්යයෙන් ම ඇමිණිය යුතුය.

v. වැට් සඳහා ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් විසින් වැට් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය. තවද, වැට් සඳහා ලියාපදිංචි වී නොමැති නම් ඒ සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් ලබා ගත් ලිපියක් ඇමිණිය යුතු ය.

vi. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියලු ලේඛන සමඟ පහත සඳහන් ලිපිනයට **2021.01.12 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන්** යොමුකළ යුතුය.

අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021" යනුවෙන් සඳහන් කළ යුතුය.

ලිපිනය: ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රසම්පාදන)
කෘෂිකර්ම අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

**02. අයදුම්කරුවන් සඳහා වන පොදු උපදෙස් සහ කොන්දේසි**

i. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් "අදාළ නොවේ" යන්න සඳහන් කරන්න.

ii. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක/ආයතනයක තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත්, එම ඉල්ලීම සළකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමඟ එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම/ආයතනය මඟින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

iii. ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ **<u>අයිතම කිසිදු වෙනසක් සිදුකළ නොහැකි බව හා අයිතම අතර මාරු කිරීම් ද සිදු නොකරන බව සලකන්න</u>.**

iv. අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය වගකීම භාර ගනු නොලැබේ.

v. **එක් අයිතමයක් සඳහා,** ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් **රු. 1,000.00 (රුපියල් දහසයි)** ආපසු නොගෙවන ගාස්තුවක් අය කරනු ලැබේ. එක් අයදුම්කරුවෙකුට අයිතම කිහිපයක් සඳහා ඉල්ලුම් කළ හැක. අයිතම ලියාපදිංචි කිරීමේ ගාස්තු **2020.12.22 දින සිට 2021.01.12** දින දක්වා කාර්යාලීය දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 2.30** දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සරප් අංශය වෙත ගෙවීමට හැකියාව ඇත.

vi. 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරී අමතන්න (කාර්යාල වේලාවන් තුළ පමණි).

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රසම්පාදන) - කෘෂිකර්ම අමාත්‍යාංශය
දුරකතන අංක - 011 2887406 / 011 2034329
011 2034300 දිගුව - 4529
ෆැක්ස් - 0112887406

vii. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (භාණ්ඩ සහ වැඩ) අංක 8.11.5 'ඇ' දරන වගන්තියේ උපදෙස් ප්‍රකාරව, **කොන්දේසි පැහැරහැර ඇති/ අසාධු ලේඛනගත** සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර නොලැබේ.

viii. මිල ගණන් ඉදිරිපත් කළ පසු සැපයීම් සඳහා අවශ්‍ය පරිදි තොග තබා ගැනීම සැපයුම්කරු/ කොන්ත්‍රාත්කරු විසින් කළ යුතු අතර, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ, ලියාපදිංචි වන

අවස්ථාවේදී අවම වශයෙන් **එක් මසක ණය පහසුකම්** සැපයීමට සියලු සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ස්වයංක්‍රීයව ම එකඟවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ix. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු/මිල ගණන් කැඳවනු ලැබේ. එසේ වුව ද අවශ්‍ය අවස්ථාවන්හිදී තෝරාගත් සීමිත සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් වෙතින් හෝ වෙනත් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් වෙතින් ලංසු/මිල ගණන් කැඳවීමේ සම්පූර්ණ අයිතිය කෘෂිකර්ම අමාත්‍යාංශය සතු වේ.

x. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන කමිටුවක් විසින් සියලු අයදුම්පත් සළකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියාපදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණකොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

xi. මිල ගණන් ඉල්ලා සිටි අවස්ථාවක වාර 3ක් තුළ මිල ගණන් ඉදිරිපත් කිරීමට හා මිල ගණන් ලබා දීමට නොහැකි බව ("No Quote") දැන්වීම හෝ ඇණවුමක් නියමිත වේලාවට ක්‍රියාත්මක කළ නොහැකි හෝ ඉල්ලා සිටි අවස්ථාවක නියැදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ සැපයුම්, පිරිවිතරයන්ට අනුකූල නොවන හෝ අනුමත නියැදියට වෙනස් සැපයුම් ඉදිරිපත් කරන හෝ සැපයුම්කරුගේ/ කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ඇත.

xii. 2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සතු වේ.

**ලේකම්**
**කෘෂිකර්ම අමාත්‍යාංශය**

කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය"
80/5,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

2020 දෙසැම්බර් මස 22 වන දින